# 8 ශ්‍රේණිය

| සතිය | ශ්‍රේණිය | නිපුණතාව | පාඩම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | 7 ශ්‍රේණිය | බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 9 ආජීව අෂ්ටමක ශීලයෙන් දිවි සරුකර ගනිමු. | • ආජීවක අෂ්ටමක ශීලය, පංචශීල ප්‍රතිපත්තියෙන් වෙනස්වන ආකාරය ප්‍රකාශ කරයි.<br>• ආජීවක අෂ්ටමක ශීලය ආධ්‍යාත්මික සංවර්ධනයට වඩාත් හේතුකාරක වන බව පිළිගනියි.<br>• සිල් සුරකිමින් නිවැරදි දිවිපෙවතක් ගත කරයි. | ආජීවක අෂ්ටමක ශීලය හඳුන්වා එයින් ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කරන ආකාරය විස්තර කරයි. | 2 |
| 2 | | | 10 ගුරු සිත සනසවා අකුරු උගනිමු සොඳවා | • සිගාලෝවාද සූත්‍රයේ ගුරු- ශිෂ්‍ය යුතුකම් පැහැදිලි කරයි.<br>• ගුරුභවතුන්ගේ ගුණ හැඳින ගෞරවයෙන් කටයුතු කළ යුතු බැව් පෙන්වා දෙයි.<br>• '' ගුරු ගෞරවයෙන් යුතුව කටයුතු කිරීමේ වැදගත්කම යන මැයෙන් කතාවකට උචිත සැලසුම සකස් කරයි.<br>• ශිෂ්‍යයෙක් ලෙස ගුරුවරයාට තම යුතුකම් මැනවින් ඉටු කරයි. | ගුරුවරුන්ගේ ගුණ හැඳින ගුරු ගෞරවය රැකෙන පරිදි කටයුතු කරන අයුරු විස්තර කිරීම (සිගාලෝවාද සූත්‍රය) | 2 |
| 3 | | සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි. | 11 ආදර්ශවත් නායකත්වය | • නායකයකුගේ වගකීම හා වගවීම පැහැදිලි කරයි.<br>• තම පෞරුෂය ගොඩනගා ගැනීමට වගකීම හා වගවීම හේතු වන බව පිළිගනියි.<br>• නායකත්ව ලක්ෂණ ලැයිස්තු ගත කරයි.<br>• නායකත්වයට ගරු කරයි.<br>• නායකයකු ලෙස කටයුතු කරයි. | නායකත්ව ලක්ෂණ (අපණ්ණක ජාතකය) | 2 |
| 4 | | | 12 සැනසුම ගෙන එන ඉවසීම | • ඉවසීමේ ගුණාංග පැහැදිලි කරයි.<br>• අවස්ථානුකූල ව ඉවසීම ප්‍රගුණ කළ යුතු බව පෙන්වා දෙයි.<br>• ඉවසීමේ ආනිශංස හා නොඉවසීමේ ආදීනව ලැයිස්තු ගත කරයි.<br>• දෛනික ජීවිතයේ වැඩ කටයුතුවලදී ඉවසීමෙන් කටයුතු කරයි. | ඉවසීම (ඉවසන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග, ඉවසීම ප්‍රගුණ කළ යුතු අවස්ථා, නොඉවසීමෙන් ලැබෙන අයහපත් ප්‍රතිඵල, ඉවසීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල) | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 5 | | බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 16 චතුරාර්ය සත්‍යය | • චතුරාර්ය සත්‍ය නිවැරදි ව නම් කරයි.<br>• දුක පිළිබඳ අර්ථකථනය කර ගැනීමට චතුරාර්ය සත්‍ය මග පෙන්වන බව පිළිගනියි.<br>• චතුරාර්ය සත්‍ය ගැලීම් සටහනකින් නිරූපණය කොට දක්වයි.<br>• ගැටලු හඳුනාගෙන ඒවා විසදාගැනීමට කටයුතු කරයි. | චතුරාර්ය සත්‍යය පිළිබඳ මූලික හැඳින්වීම | 2<br>2 |
| 6 | | ජීව අජීව පරිසරයට හිතකාමීව හැසිරෙයි. | 17 වළකිමු වරදින් උපමා කොට තමන් | • වේළුද්වාර සූත්‍රයේ දැක්වෙන අත්තූපනායික ධර්මය පැහැදිලි කරයි.<br>• තමා උපමා කොට කටයුතු කළයුතු බව පිළිගනියි. | අත්තූපනායික ධර්ම පර්යාය (වේළුද්වාර සූත්‍රයේ නිදාන කථාව ඇසුරෙන්) අධිපති ධර්ම | 2 |
| 7 | | ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැකගැනීමට ක්‍රියාකරයි. | 19 මහින්දාගමනය | • මහින්දාගමනයෙන් ලත් දායාද මොනවා දැයි පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලාංකිකයන්ට උරුම වූ එම දායාද සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි.<br>• මහින්දාගමනයෙන් ලත් දායාද පිළිබඳ පොතක් නිර්මාණය කරයි.<br>• ශාසනික හා සංස්කෘතික දායාද ආරක්ෂා කරයි. | මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකේය දායාද පිළිබඳ සරල හැඳින්වීමක් (බුදුදහම, බෞද්ධ සිද්ධස්ථානයක අංග, භික්ෂු භික්ෂුණී පැවිද්ද, කලා ශිල්ප, සාහිත්‍ය) | 2 |
| 8 | | නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි. | 21 දෙලෝ වැඩ සාධන පින් කිරියවත් | • පුණ්‍ය ක්‍රියා නම් කරයි.<br>• පින්කම්හි අගය දැන එහි නියැලෙයි.<br>• තුන් පුණ්‍ය ක්‍රියා, දස පුණ්‍ය ක්‍රියා සහ දොළොස් පුණ්‍ය ක්‍රියා වෙන් වෙන්ව ලැයිස්තුගත කරයි.<br>• ආදර්ශවත් පුණ්‍යකාමී දිවියක් ගත කරයි. | පුණ්‍ය ක්‍රියා (කාව්‍යශේඛරය) | 2 |
| 9 | 8 ශ්‍රේණිය | තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි. | 2 බොදු සිරිත් පිළිපැද වෙමු අපි සොඳුරු දරුවන් | • බුදු සිරිතෙන් ප්‍රකට වන සමාජ ආචාර ධර්ම පැහැදිලි කරයි.<br>• සමාජයේ යහපැවැත්මට ආචාර ධර්ම හේතු වන බව පිළිගනියි.<br>• සමාජ ආචාර ධර්ම ලැයිස්තු ගත කරයි.<br>• සමාජ ආචාර ධර්ම අනුගමනය කරයි. | බුද්ධ චරිතයෙන් ප්‍රකට වන සමාජ ආචාර ධර්ම (ආගන්තුක සත්කාරය, අනතිමානී බව, අල්පශබ්දතාව, සුහදශීලි කතාබහ, මහජන මතයට කන්දීම) | 2 |
| 10 | | | 3 ධර්ම රත්නයේ ගුණ | • ධර්ම රත්නයේ ගුණ අනුපිළිවෙළින් පැහැදිලි කරයි.<br>• දහම් ගුණ ජීවමාන බව පිළිගනියි.<br>• විචාරශීලී ව කටයුතු කරයි.<br>• ධර්මානුකූලව ජීවත් වෙයි. | ධර්ම රත්නයේ ගුණ | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | | ජීවන රටාව හැඩගස්වා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි. | 5 බුදුගුණ සිහිකර බවුන් වඩමු | • බුදුගුණ භාවනාවේ යෙදෙන අයුරු තම වචනයෙන් පවසයි.<br>• බුදුගුණ භාවනාවෙහි ආනිශංස රැසක් ඇති බව පිළිගනියි.<br>• දෛනිකව නිවැරදි ව බුදුගුණ භාවනාවේ යෙදෙයි. | බුද්ධානුස්සති භාවනාව | 2 |
| 12 | | | 7 පමාබවෙන් මිදුණු කෙනෙක් මුළු ලෝකයම එළිය කරයි. | • ධම්ම පද ගාථා දෙකෙහි සරල අරුත පවසයි.<br>• වැරදි කළ අයකුට වුවද කළ වරද තේරුම් ගෙන යහපතෙහි පිහිටා නිවරදි පුද්ගලයකු විය හැකි බව පිළිගනියි.<br>• ධම්ම පද ගාථා දෙක නිවැරදි ව මතකයෙන් සජ්ඣායනය කරයි.<br>• කරන ක්‍රියාවට පෙර එහි ප්‍රතිඵල පිළිබඳ සැලකිලිමත් වෙයි. | යෝච පුබ්බේ පමජ්ජිත්වා සහ යස්ස කම්මං කථං පාපං යන ධම්මපද ගාථා දෙක | 2 |
| 13 | | | 8 සඟරුවනට අනුව හුරුපුරුදු වෙමු සුසිරිත් | • ''සේඛියා ධර්ම'' යන්න පැහැදිලි කරයි.<br>• කථා බහ, ඇඳුම, ගමන බිමන ආචාරශීලී විය යුතු බව පිළිගනියි.<br>• සේඛියා ධර්ම ඇසුරෙන් ආචාර ධර්ම ලේඛනයක් සකස් කරයි.<br>• දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම පිළිපදියි. | සේඛියා ධර්ම (පරිමණ්ඩල වග්ග, කබල වග්ග, සුරු සුරු වග්ග) | 2 |
| 14 | | බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 9 ශීල ශික්ෂාවේ ඉදිරි පියවර | • අෂ්ටාංග උපෝෂථ සීලය හා දස සීලය නම් කරයි.<br>• අෂ්ටාංග උපෝෂථ ශීලය හා දස සීලය, සීලයෙහි ඉදිරි පියවරක් බව පිළිගනියි.<br>• සීලයෙහි හරවත් බව හා ප්‍රායෝගික බව පැහැදිලි කරමින් පැවැත්වෙන කථාවකට සැකිල්ලක් පිළියෙල කරයි.<br>• පොහෝ දිනවල සිල් සමාදන් වෙයි.<br>• ශික්ෂාකාමී ජීවිතයක් ගත කරයි. | අෂ්ටාංග උපෝසථ සීලයෙහි හා දස සීලයෙහි ඇති හරවත් බව හා ප්‍රායෝගික බව | 2 |
| 15 | | | 10 උගනිමු අඹු සැමි හිත මිතුරු යුතුකම් | • සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන අඹු සැමි හා හිත මිතුරු සබඳතාවන්හි යුතුකම් පැහැදිලි කරයි.<br>• යුතුකම් ඉටු කිරීම මගින් අයිතිවාසිකම් සුරැකෙන බව පිළිගනියි.<br>• අඹු- සැමි හා හිත මිතුරු යුතුකම් වගුගත කරයි.<br>• යහපත් මිතුරකු ලෙස කටයුතු කරයි.<br>• යුතුකම පදනම් කරගත් ජීවිතයක් ගතකරයි. | සිගාලෝවාද සූත්‍රයේ එන අඹු සැමි හා හිත මිතුරු යුතුකම් | 2 |
| 16 | | බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැදිනගෙන ප්‍රඥාවන්ත | 15 හලොත් යෙහෙකි පවුකම් නොතබාම සිත | • බුදු දහමෙහි ඉගැන්වෙන කර්ම සංකල්පය පැහැදිලි කරයි.<br>• සියල්ල කර්ම විපාක වශයෙන්ම සිදු නොවන බව පිළිගනියි.<br>• බුදු දහමෙහි ඉගැන්වෙන කර්ම සංකල්පය පිළිබඳ ලිපියක් ලියයි. | කර්මය පිළිබඳ සරල හැඳින්වීමක් | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ජීවිතයක් ගත කරයි. | | • නිවැරදි ක්‍රියාවන්හි යෙදෙයි.<br>• කර්මපල විශ්වාසයෙන් කටයුතු කරයි. | | |
| 17 | | | 17 බුදු සිරිත හා බැඳුණු තුරුලතා රැකගනිමු | • බුදු සිරිත තුරුලතා හා බැඳී ඇති බවට නිදසුන් සපයයි.<br>• සියලු සතුන්ගේ පැවැත්මට තුරුලතා මහෝපකාරී වන බව පිළිගනියි.<br>• රුක් රෝපණයට හා සංරක්ෂණයට දායක වෙයි.<br>• පරිසරයට ආදරය කරයි. | • තුරුලතා හා සබැඳි බුදු සිරිතේ වැදගත් සිදුවීම්<br>• සත්ත්ව ජීවිත තුරුලතා මත රැකෙන බව<br>• රුක් රෝපණයේ සහ සංරක්ෂණයේ වැදගත්කම | 2 |
| 18 | | ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකේය බෞද්ධ උරුමය හැදින එය රැක ගැනීමට ක්‍රියා කරයි. | 18 සසුන් කෙත රැක්මට බැඳුන රන් වැට | • ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ කරුණු පැහැදිලි කරයි.<br>• ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසදාගත හැකි බව පිළිගනියි.<br>• ප්‍රථම ධර්ම සංගායනාව හා බැඳුණු කරුණු වගුගත කරයි. | • ප්‍රථම ධර්ම සංගායනාව හා සසුන සුරක්ෂිත කිරීමට ගත් ක්‍රියා මාර්ග | 2 |
| 19 | | බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැදිනගෙන ඒ අනුව ක්‍රියාකරයි. | 20 සැපවත් ජීවිතයකට මග | • අණන සූත්‍රයට අනුව ධනෝපායනය හා ධන පරිහරණය කරන අයුරු පැහැදිලි කරයි.<br>• දැහැමි ධනෝපායන මාර්ග අනුගමනය කළ යුතු බව පිළිගනියි.<br>• ධනෝපායනය හා ධන පරිහරණය නිවැරදිව සිදු කිරීමට මගපෙන්වන උපදෙස් පත්‍රිකාවක් සකසයි.<br>• දැහැමි පරිභෝජන රටාවකට හුරු වෙයි.<br>• ධාර්මික රැකියාවක නිරත වෙමින් සුවදායී ජීවිතයක් ගත කරයි. | ධනෝපායනය, ධනපරිහරණය, අණන සූත්‍රය ඇසුරෙන් | 2 |
| 20 | | නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයෙහි ගමන් කරයි. | 21 මහාමංගල සූත්‍රය | • මහා මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණු පැහැදිලි කරයි.<br>• නිවැරදි දැක්මකින් යුතුව කායික, වාචසික හා මානසික ක්‍රියාවන්හි නිරත විය යුතු බව පිළිගනියි.<br>• මහා මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණු ජීවිත අවධි අනුව වැදගත් වන ආකාරය වගුගත කරයි.<br>• යහපත් කායික වාචසික හා මානසික චර්යාවන්හි යෙදෙයි. | මහා මංගල සූත්‍රයේ අන්තර්ගතය බාල තරුණ හා වැඩිහිටි යන ජීවිත අවධි අනුව වැදගත්වන ආකාරය. | 2 |